**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>හය වන ජාත්‍යන්තර යෝගා දිනය ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානයේදී සැමරේ</u>**

2020 ජූනි 21 වන දින හය වන ජාත්‍යන්තර යෝගා දිනය නිමිත්තෙන් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකා යුධ හමුදාව සමඟ එක්ව සංවිධානය කළ යෝගා වැඩසටහනක් කොළඹ යුධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සහ ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ විශේෂ පණිවිඩ මෙම අවස්ථාවේදී විකාශය කෙරිණ.

2. ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා , ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා , සම්භාවනීය අමුත්තන් රැසක් සහ හමුදා සාමාජිකයන් මෙම අවස්ථාවට සහභාගී විය. පනාගොඩ, බටහිර ආරක්ෂක සේනා මූලස්ථානය සහ ත්‍රිකුණාමලය, නාවික සහ සමුද්‍රීය ඇකඩමියද අන්තර්ජාලය ඔස්සේ මෙම වැඩසටහන හා සම්බන්ධ විය.

3. ශ්‍රී ලංකාවේ කොවිඩ් වසංගතයට එරෙහි සටනේදී ඉදිරිපෙළ කටයුතු කරමින් ශ්‍රී ලංකා යුධ හමුදාව කරන මෙහෙවර අගය කරමින් මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා පවතින වසංගත තත්වය තුළ ප් රතිශක්තිය ගොඩනැගීම සහ මානසික ආතතිය අඩු කිරීම සඳහා යෝගා සහ අයුර්වේදයේ ප්‍රතිලාභ පිළිබඳව සඳහන් කළේය. අද වන විට ලොව පුරා බිලියන ගණනක් ජනතාව වර්ණ, ආගම්, භාෂා හෝ ජාති භේදයකින්

තොරව කුමන හෝ යෝගා ක්‍රමයක් කරන බවත් නිරෝගීභාවය, සතුට, අභ්‍යන්තරය පිළිබඳ මනා දැනුවත්භාවය සහ අවබෝධය වැනි ප්‍රතිලාභ භුක්ති විඳින බවත් එතුමා ප්‍රකාශ කළේය.

4. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා මෙම අවස්ථාව අමතමින් ප්‍රකාශ කළේ වසර දහස් ගණනක් පුරා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පවතින එකමුතුභාවය යෝගා තුළින් පිළිඹිබු වන බවයි. පවතින තත්වය හමුවේ නිර්දේශිත සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් ජාත්‍යන්තර යෝගා දිනය සැමරීම සම්බන්ධයෙන් යුධ හමුදාපතිතුමා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට සිය ප්‍රශංසාව පළ කළේය. අතත්‍ය යෝගා වැඩසටහන තුළින් සියලු සහභාගීවන්නන්ට කය, මනස සහ ආත්මය එකිනෙක සම්බන්ධ කරන සෞඛ්‍යමත් අත්දැකීමක් ලබා ගැනීමට ඉවහල් වූ වටිනා අවස්ථාවක් උදා කරදුන් බව එතුමා ප්‍රකාශ කළේය.

5. මෙය ශ්‍රී ලංකා යුධ හමුදාව ජාත්‍යන්තර යෝගා දින වැඩසටහන සඳහා අඛණ්ඩව සහභාගී වූ තෙවන වසර වේ. මෙවර යෝගා දින සැමරුම සමාජ දුරස්ථකරණ ක්‍රමවේද සහ අනෙකුත් සෞඛ්‍ය නිර්දේශ අනුගමනය කරමින් සංවිධානය කර තිබිණ. මෙම දිනය සමරමින් තවත් විවිධ වැඩසටහන් රාශියක් දවස පුරා ශ්‍රී ලංකාවේ දී පැවැත්විණ.

*****

කොළඹ

ශක වර්ෂ 1942 ජ්‍යෙෂ්ත 31

2020 ජූනි 21